පිටබැද්දර ප්‍රාදේශීය සභාව - 2024
---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී ජනතා ජංගම සේවා වැඩසටහනක් සඳහා වැයකර තිබුණු රු.මිලියන 0.1 ක මුදල, ප්‍රතිපූර්ණය විය යුතුව තිබුණද, එම මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස සටහන් කර නොතිබුණි.	නිරීක්ෂණය පිළිගෙන ඇති බව.	ප්‍රතිපූර්ණය විය යුතු මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ආයුර්වේද ඖෂධ තොගවල වටිනාකම රු.53,771 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි ශේෂයක් දක්වමින් වාර්තා පිළියෙල කරන බව.	ඖෂධ ලේඛන සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල තොග ශේෂය ලෙස දැක්විය යුතුය. අඩුවෙන් දක්වා ඇති ශේෂයන් ඖෂධ තොග ගිණුමෙහි ගැලපිය යුතුය.
(ඇ)	ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය අළුත්වැඩියාවේදී තීන්ත ආලේප කිරීම සඳහා දරන ලද රු.මිලියන 0.58 ක් වූ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි.	නිරීක්ෂණය පිළිගෙන 2025 ගිණුමෙන් නිවැරදි කරන බව.	ප්‍රාග්ධනිත කර තිබූ රු.මිලියන 0.58 ක මුදල ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙන් ඉවත් කළ යුතුය.
(ඈ)	සභාව සතු රු.මිලියන 0.25 ක් වූ ජලටැංකි 11 ක වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත නොකර ජල ගබඩා තොග යටතේ ගිණුම්ගතකර තිබුණි.	2025 දී ජල ගබඩා තොග ගිණුමින් ඉවත්කර ඇති බව.	ජල ටැංකි 11 හි වටිනාකම ජල ගබඩා තොගවලින් ඉවත්කර උපකරණ ගිණුමට ගැලපිය යුතුය.

(ඉ)	ලැබිය යුතු රු.මිලියන 0.15 ක දැන්වීම් පුවරු ගාස්තු ආදායම ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.	මුදලින් ලැබෙන දැන්වීම් පුවරු ගාස්තු පමණක් බිල් කරන බවත් හිඟ මුදල් ගිණුමේ නොපෙන්වන බව.	වර්ෂයට නියමිත මුළු දැන්වීම් පුවරු ආදායම ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.මිලියන 0.24 ක වෙනසක් නිරීක්ෂණය විය.	2025 මූල්‍ය ප්‍රකාශනවලින් ගැලපුම් කරන බව.	මූල්‍ය ප්‍රකාශන සහ අනුරූපී වාර්තා අතර වෙනස සොයාබලා වාර්තා හා මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය	මෙම වගන්තියට අනුකූල නොවී තෙදින අධ්‍යයන චාරිකාවක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ එකතුව රු.මිලියන 0.33 ක වියදමක් සභා අරමුදලින් වැයකර තිබුණි.	ව්‍යාපෘති සැලැස්මක් සකස් කර මුදල් කමිටුවේ අනුමැතිය මත වියදම් දරා ඇති බව හා ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු නොවන බව.	ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.මිලියන 14.53 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු. මිලියන 14.16 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	බදු	1,567,955	2,218,500	2,224,325	892,888	1,696,000	1,763,365	2,564,981	898,713
(ii)	කුලී	5,408,546	8,999,200	9,013,736	2,944,826	23,048,240	17,098,748	16,848,183	2,959,362
(iii)	බලපත්‍ර ගාස්තු	1,527,425	1,451,777	1,460,177	98,522	1,155,100	1,182,576	1,147,176	106,922
(iv)	වෙනත් ආදායම්	3,798,000	7,076,993	6,912,806	573,570	2,846,500	5,051,973	4,899,596	409,383
		12,301,926	19,746,470	19,611,044	4,509,806	28,745,840	25,096,662	25,459,936	4,374,380

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වන වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ වශයෙන් 2021 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු වරිපනම් ඒකක 1480 කින් වරිපනම් අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ එකතුව කඩිනමින් තක්සේරුව සිදු කිරීමට ජංගම ලේඛනය 2025 පෙබරවාරි 19 දින තක්සේරු දෙපාර්තමේන්තුවට භාරදී ඇති බව.	කඩිනමින් දේපල තක්සේරුව සිදුකර වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතුය.

(ii)	සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.මිලියන 0.31 ක් වූ අක්කර බදු හිඟ ශේෂයෙන් රු.මිලියන 0.30 ක් වූ වර්ෂ 03 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණ අතර, එය මුළු හිඟයෙන් සියයට 99 ක ප්‍රතිශතයක් විය.	දීර්ඝ කාලීන හිඟයෙන් රු.101,427 ක් කපා හැරීමට ආණ්ඩුකාර අනුමැතියට ඉදිරිපත් කර ඇති බව හා ඉතිරි හිඟය සඳහා ග්‍රාම නිලධාරීගෙන් තොරතුරු ලබා ගනිමින් පවතින බව.	හිඟ මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.මිලියන 0.45 ක් වූ හිඟ කසළ බදු ආදායමින් රු.මිලියන 0.36 ක් ශේෂ වර්ෂ 03 ක් ඉකුත් වී තිබූ අතර එය මුළු හිඟයෙන් සියයට 81ක ප්‍රතිශතයක් විය.	දීර්ඝ කාලීනව සිට පැවතෙන හිඟය කපා හැරීමට අවශ්‍ය තොරතුරු ලබා ගනිමින් පවතින බව.	හිඟ මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) කුලී

(i)	සමාලෝචිත වර්ෂය අවසන් දිනට සභාව සතු කාමර 60 කින් රු.මි.2 ක කඩ කුලී හිඟව පැවති අතර, ඉන් රු.මිලියන 1.74 ක් වසර 03 ක කාලය ඉක්මවා පැවතුණි.	2025 අප්‍රේල් 20 දින වන විට රු.454,330 ක් අයකර ගෙන ඇති බව.	හිඟ කඩ කාමර කුලිය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සභාව බදු දී තිබුණු කඩ කාමර 42 ක ගිවිසුම් කල් ඉකුත් වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.	කඩ කාමර 42 න් කඩ කාමර 20 ක ගිවිසුම් යාවත්කාලීන කර ඇති බව.	කල් ඉකුත් වූ සියළු ගිවිසුම් යාවත්කාලීන කළ යුතුය.

(ඇ) වෙනත් ආදායම්

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.මිලියන 0.33 ක් හා මුද්දර ගාස්තු රු.මිලියන 8.93 ක් විය.	හිඟ උසාවි දඩ රු.මිලියන 0.87 ක් හා මුද්දර ගාස්තු රු.මිලියන 11.76 ක් අයකරගෙන ඇති බව.	සියළු හිඟ මුදල් කඩිනමින් අයකර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එක්රැස් කරන ටොන් 1 ක පමණ වූ කසළ තොගය බැහැර කිරීමට ස්ථිර හා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකර ජනාකීර්ණ සහ ප්‍රධාන ජල මූලාශ්‍රයක් වන නිල්වලා ගඟ අසල පිහිටි මොරවක පොළ භූමියේ පිටුපස බැහැර කිරීමෙන් නිල්වලා ගඟේ ජලය අපවිත්‍ර වීම හා වසංගත රෝග පැතිරයාමේ අවදානමක් පැවතුණි.	සභාවට කොම්පෝස්ට් අංගනයක් නොමැති නිසා සභාවට අයිති වනසිංහකන්ද ඉඩම තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමට යෝජිත බව.	කසළ බැහැර කිරීමට විධිමත් හා ස්ථිර වැඩ පිළිවෙලක් කඩිනමින් ආරම්භ කළ යුතුය.
(ආ)	කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වනසිංහ කන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ අක්කර 20 ක ඉඩමක් පවරාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.	මේ සම්බන්ධව දැනුවත් කර ලිපි යොමුකර ඇති බව.	කසළ බැහැර කිරීමට විධිමත් හා ස්ථිර වැඩ පිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.
(ඇ)	මොරවක ජල ව්‍යාපෘතියට අදාළ ජල මූලාශ්‍රය කොටපොළ ප්‍රාදේශීය සභාවට අයත් බැවින් මාසික ජල පාරිභෝගික ලැබීම්වලින් සියයට 20 ක් කොටපොළ ප්‍රාදේශීය සභාවට ගෙවා තිබුණද මේ සම්බන්ධයෙන් කොටපොළ ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. මෙම ජල මූලාශය ප්‍රාදේශීය සභා දෙක විසින්ම සංවර්ධනය නොකිරීම නිසා අධික වැසි සහිත දිනයන්හිදී ජලයට මඩ මිශ්‍රවීම, ජල නළ කැඩී යාමෙන් ජල සැපයුම අඩාලවීම, ජලය සමඟ වැලි මිශ්‍රව පැමිණීමෙන් ජල මණු අක්‍රියවීම සිදුවන අතර ජල පැමිණිලි සංඛ්‍යාවද වැඩිවෙමින් පැවතුණි.	ඉදිරියේදී ගිවිසුම්ගත වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	කොටපොළ ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුම්ගතවී මහජනතාවට පිරිසිදු පානීය ජලය සැපයීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් පරිභෝගිකයන්ගෙන් ලබාගන්නා තැන්පතු මුදල සැලකිල්ලට ගෙන හිඟ ජල බිල්පත් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා 2025 ජනවාරි 24 විගණන දින වන විටත් ගෘහස්ත ජල පරිභෝගික හිඟය රු.මිලියන 0.26 ක්, හා වාණිජ ජල පාරිභෝගික හිඟය රු.මිලියන 0.26 ක් ද වී තිබුණි.	රු.573,570 ක හිඟයෙන් රු.274,518 ක් අයකර ගෙන ඇති අතර, ඉතිරි හිඟ ශේෂය වන රු.299,02 ක මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ශේෂය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර තැන්පතු මුදල ඉක්මවීමට පෙර හිඟ ශේෂය අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් මොරවක පොළ භූමියේ ඉදිකර තිබුණු නළ ළිං දෙකෙහි ජලය අධික යකඩ සාන්ද්‍රනයකින් යුක්ත පාරිභෝජනයට නුසුදුසු තත්ත්වයක පැවතියද, එම ජලය පිරිපහදු කිරීම සඳහා කිසිඳු වැඩපිළිවෙලක් සකස් කිරීමකින් තොරව 2021 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ පළාත් නිශ්චිත ප්‍රතිපාදන මත රු.මිලියන 1.03 ක් වැයකර ඉදිකර තිබුණු ජල ගබඩා ටැංකිය සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිෂ්කාර්ය තත්ත්වයකට පත්ව තිබුණි.	මොරවක බස්නැවතුම් පොළ තුළ ඉදිකර තිබූ ළිඳ ඉවත් කර ඇති අතර පොළ භූමියේ ළිඳ ඉතිරිව ඇති බවත් ළිඳෙහි ජලය පිරිපහදු කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුව ඇති බැවින් මෙම ව්‍යාපෘතිය නිශ්කාර්යව පවතින බව.	ව්‍යාපෘති සැලසුම් කිරීමේදී නිවැරදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර, එසේ සිදු කිරීමෙන් තොරව සිදු කළ මෙම ව්‍යාපෘති භාවිතයට ගත හැකි තත්ත්වයට කටයුතු කළ යුතු අතර නොඑසේනම් ක්‍රියාත්මක කළ පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	2022 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන චක්‍රලේඛ අංක 2022/01 අනුව සියළුම පළාත් පාලන ආයතන විසින් මහජනයා වෙත ලබාදෙන සේවා පහසු කිරීම, කාර්යක්ෂම කිරීම සහ ආදායම් කඩිනමින් එක්රැස් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේද හඳුන්වාදීම අනිවාර්ය වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර මාර්ගගත ගෙවීම් පහසුකම් සැලසීමට කටයුතු කර නොතිබුණි.	වෙබ් අඩිවිය නිර්මාණය කර ගැනීම සඳහා ආයතනය තෝරා ගෙන ගිවිසුම් ගත වී වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව.	වෙබ් අඩවිය නිර්මාණය කර මාර්ගගත ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය පහසුකම් කඩිනමින් සලසා දිය යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභා බල ප්‍රදේශයේ 2023 හා 2024 වර්ෂවල විකුණා තිබුණු ඉඩම් කැබලි 5 ක් වෙනුවෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව සභාවට අයවිය යුතු රු. 90,000 ක් අයකර නොතිබුණි.	ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණන ලද ඉඩම් නොවන බව හා පෞද්ගලික ඉඩම්වලට අදාළව ඉඩම් අනුබෙදුම් සහා අනුමැතිය ලබාදීමේදී විකුණුම් වටිනාකමින් සියයට 1 ක් අයකර ගැනීම සහා උපදෙස් ඉල්ලා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලිපි යොමු කර ඇති බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන අවස්ථාවක සියයට 1ක බදු මුදල් අයකරගත යුතුය.
(ආ)	සභා බලප්‍රදේශයේ ක්‍රියාත්මක වන ආයතන 08 ක පරිසර ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාල සීමාව ඉකුත්වී තිබුණු නමුත් ඒ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණු අතර, ව්‍යාපාර ආයතන 09 ක් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් එකතුව රු.40,500 ක් වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු සභාවට අහිමි වී තිබුණි.	බලපත්‍රය ලබාදීමට අවශ්‍ය ඉදිරි කටයුතු ඉටු කරමින් පවතින බව හා ආයතන 2 කට බලපත්‍රය ලබාදී ඇති බව.	පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු කිරීම හා නොඑසේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතුව පවතින අක්කර 12 ක් පමණ වූ ඉඩම් 17 ක හා ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවූ ඉඩම් කැබලි 04 කට අදාළව නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් අයිතිය හිමි ප්‍රාදේශීය ලේකම්ගෙන් අයිතිය පවරා ගැනීමට ඉල්ලුම් කර ඇති බව.	නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීම හා ඔප්පු සකස් කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	ඉඩම් කැබලි 6 කට අදාළව සුදුසු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු නොකිරීම නිසා එම ඉඩම් නිශ්කාර්යව පැවතුණි.	ඉදිරියේදී ඵලදායි කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව.	ඉඩම්වල සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සේවක සංඛ්‍යා සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට තනතුරු 14 ක් අතිරික්තව පැවතුණි.	2025 වර්ෂයේදී අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරන බව.	කාර්ය මණ්ඩලය පිළිබඳ සමාලෝචනය කර, අතිරික්ත තනතුරු සම්බන්ධ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2011 වර්ෂයත් 2023 වර්ෂයත් අතර කාලසීමාව ඇතුළත විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සභාවේ නිලධාරීන් 05 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 0.29 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කරගෙන නොතිබුණි.	හිඟ මුදල අයකර ගැනීමට ලිපි යොමුකර ඇති බව.	හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාවේ ප්‍රාථමික ශ්‍රේණියේ කම්කරුවන් 14 දෙනෙකු වෙත තනතුරට අදාළ නොවන වෙනත් රාජකාරි පවරා තිබුණු අතර, 2024 වර්ෂය තුල රු.මිලියන 7.92 ක වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණි.	වෙනත් රාජකාරිවල යෙදවූවද ස්ථිර තනතුරට හිමි වැටුප ගෙවන බවත් අනුමත රියදුරන් ප්‍රමාණවත් නොවන නිසා සෞඛ්‍ය හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් රියදුරන් ලෙස සේවයට යොදවා ගන්නා බව.	කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී තථ්‍ය අවශ්‍යතාව පිළිබඳ නිවැරදිව හඳුනාගත යුතු අතර, නිලධාරීන් නියමිත තනතුරේ රාජකාරිවල යෙදවිය යුතුය.